පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සතිය - 5

විෂය - නර්තනය

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා

Department of Education, Sabaragamuwa Province/ Weekly School

නිපුණතා මට්ටම : විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි.

ක්‍රියාකාරකම : <u>**කවි පද ප්‍රස්තාර කරමු.(ක්‍රියාකාරකම - 03)**</u>

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ මාත්‍රා 3+3 හා 3+4 තාල රූපයේ කවි පද, බෙර පද පසුගිය සතියන්හිදී ප්‍රස්තාර කරන්නට ඇත.

දෙවන පියවර : එම ප්‍රස්තාර කළ ක්‍රමවේදයන් නැවත වරක් සිහියට නගාගන්න.

තුන්වන පියවර : මෙම සතියේදී ඔබ කඩතුරා, පන් නෙළීමේ, ගොයම්, සොකරි කවි ප්‍රස්තාර කළ යුතුව ඇත.

හතරවන පියවර : ඔබ උගත් ප්‍රස්තාරකරණ ක්‍රමවේදයන්ට අනුව පහත කවි ප්‍රස්තාර කළ හැකිදැයි බලන්න.

කඩතුරා කවි :- මාත්‍රා 3+3

සිහින් සිනිදු සළුව පැලද විත් උන් මරගන
වහන්ස නුඹ අප අතහැර මන්ද මහන උන
අහංකාර ඒ මරගන දැක්කා බුදු ගුණ
මිහින්තලා ධාතු බලෙන් කඩතිර හරිමින

කඩතුරා කවි :- මාත්‍රා 3+3

සිද්ධ මුනිඳු වැඩසිට බෝ මුල විදුරාසන
යුද්ධ කරන්නට දස බිම්බර විත් පැරදුණ
වැද්ද නොදී හැම පිරිපත දුරලා හරිමින
බුද්ධ රත්නෙ අනුහසයෙන් කඩතිර හරිමින

පන් නෙළීමේ කවි :- මාත්‍රා 3+3

කොනින් කොනට පන් උදුරා ගන්නේ
තැනින් තැනට පන් අහුරු දමන්නේ
උනුනගේ පන් කොළ එක් නොකරන්නේ
බැණුන් අහන්නට වෙයි දූනගන්නේ

පන් නෙළීමේ කවි :- මාත්‍රා 3+3

ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට
මූණ පුරා තෙල් ගාගෙන යන කලට
මාන බලති මිණිවන් පන් තිබෙන කොට
නෑනෝ නුඹත් එනවද පන් නෙළන්නට

ගොයම් කවි :- මාත්‍රා 4+4

රන් දෑ කැති ගෙන නිති සැරසෙනවා
රත්‍රන් පටි ඉන වට දිලිසෙනවා
රිවි දුටු පිණි බිඳු ලෙස පහ වෙනවා
දුම්බර කෙතේ අපි ගොයම් කපනවා

ගොයම් කවි :- මාත්‍රා 3+3

ඉරු දෙවියන්ගේ ඉර ගල ගාවා
සඳ දෙවියන්ගේ සඳ ගල ගාවා
සණ දෙවියන්ගේ කෝවිල ගාවා
උපිත් කියමු කවි කෝවිල ගාවා

සොකරි කවි :- මාත්‍රා 3+3 (සොකරි)

සොකරී එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
පද අල්ලන්නී පියයුරු ලැම ෙ සාලවන්නී
කැඩපත ගන්නි සුරතින් මුහුණ බලන්නී

සොකරි කවි :- මාත්‍රා 3+3 (වෙදරාළ)

වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙව්ලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
විදා පාන්නේ අත් දෙක තැගි කියන්නේ

***